# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 23 දරන වාරිමාර්ග
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජූලි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජූලි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 55 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජූලි මස 13 වන දින.]

එල්. ඩී.—ඕ. 42/81

**වාරිමාර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) වාරිමාර්ග ආඥාපනතේ 65 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *453 වන අධිකාරයේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"65. (1) යම් තැනැත්තකු විසින් යම් ඇළක්, ඇළ මාර්ගයක්, ජල මාර්ගයක් හෝ වැවක්, අවහිර කරන හෝ අයුතු ලෙස අල්ලා ගන්නා හෝ යම් ඇළකට, ඇළ මාර්ගයකට, ජල මාර්ගයකට හෝ වැවකට හෝ ඒ ඇළට, ඇළ මාර්ගයට, ජල මාර්ගයට හෝ වැවට සම්බන්ධ යම් වාරිමාර්ග ඉදිකිරීමකට අලාභහානි කරන ලද අවස්ථාවක, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් කාල යක් ඇතුළත්, ඒ අවහිර කිරීම ඉවත් කරන ලෙස හෝ ඒ අයුතු ලෙස අල්ලා ගැනීම නතර කරන ලෙස හෝ ඒ අලාභහානිය අලුත්වැඩියා කරන ලෙස දිසාපතිවරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය. *අවහිර කිරීම සහ අයුතු ලෙස අල්ලා ගැනීම ඉවත් කිරීම සහ අලාභහානි අලුත්වැඩියා කිරීම.*

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ දැන්වීමේ සඳහන් කාලය තුළ එහි වූ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් හෝ ඒ දැන්වීම භාර දිය යුතු නියම තැනැත්තා කවුද යන්න ගැන යම් සැකයක් ඇත්තේ නම් එසේම ඒ අවහිර කිරීම ඉවත් කරවීමට හෝ ඒ අයුතු ලෙස අල්ලා ගැනීම නතර කරවීමට හෝ ඒ අලාභහානිය අලුත්වැඩියා කරවීමට හෝ දිසාපතිවරයා විසින් සැලැස්වීම නීත්‍යානුකූල විය යුතු ය. තව ද, දිසාපතිවරයා විසින් ඒ කාර්ය සඳහා යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට කම්කරුවන්, මෙවලම් සහ අවශ්‍ය දේ සමග ඇතුළු වනු ලැබීම සහ එහි දී ඒ ඉවත් කිරීමට හෝ නතර කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය සියලු දේ කරගෙන යාමට හෝ කරවනු ලැබීමට සැලැස්වීම නීත්‍යානුකූල විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි "65 වන වගන්තිය යටතේ යම් අවහිරයක් ඉවත් කිරීම හෝ අයුතු ලෙස අල්ලා ගැනී මක් නතර කිරීම ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන ලද වියදම්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "65 වන වගන්තිය යටතේ යම් *ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.*

අවහිරයක් ඉවත් කිරීම හෝ අයුතු ලෙස අල්ලා ගැනීමක් නතර කිරීම හෝ අලාභ හානියක් අලුත්වැඩියා කිරීම ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන ලද වියදම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

66අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 66අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"11 වන වගන්තියේ විධිවිධාන හෝ 64 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග හෝ කඩ කිරීම.

66අ. යම් තැනැත්තකු විසින්—

(අ) 11 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි (ආ) ඡේදයේ විධිවිධාන කඩ කරමින් යම් ඉඩමක් වගා කරන;

(ආ) 11 වන වගන්තියේ විධිවිධාන හෝ 64 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරමින් යම් වාරි කර්මාන්තයකින් වතුර ලබා ගන්නා වූ සහ ඒ මගින් ඒ වතුර ලබා ගැනීමට හිමිකම් ඇති යම් ගොවියකුට යම් අලාභයක් සිදු කරන

අවස්ථාවක දිසාපතිවරයා විසින්—

(i) (අ) ඡේදයේ සඳහන් ඉඩමට වතුර සැපයීම ප්‍රතික්ෂේප කිරීම නීත්‍යනුකූල විය යුතු ය;

(ii) (ආ) ඡේදයෙහි දක්වා ඇති ආකාරයට ජලය ලබා ගැනීමෙන් වගා කරන ලද ඉඩමෙහි අස්වැන්න එකතු කර ගැනීම නීත්‍යනුකූල විය යුතු ය;

(iii) (ආ) ඡේදයෙහි සඳහන් ගොවියාට දරන්නට සිදුවූන අලාභය සහ ඒ ඡේදය යටතේ ලබා ගන්නා ලද වාරිමාර්ග ජලයේ වටිනාකම ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම සහ එසේ අයකර ගන්නා ලද මුදලින් ඒ ගොවියාට වන්දි ගෙවීම නීත්‍යනුකූල විය යුතු ය. එසේ දරන ලද අලාභයේ ප්‍රමාණය සහ එසේ ලබා ගන්නා ලද වාරිමාර්ග ජලයේ වටිනාකම එම

වාරිමාර්ග ජලයෙන් ජලය සපයනු ලැබිය හැකි බිම් ප්‍රමාණය සහ එම ඉඩම පිහිටි ප්‍රදේශයේ එක් අක්කරයක සාමාන්‍ය අස්වැන්න පදනම් කරගෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධරයකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ය. ඒ තක්සේරුව අවසානාත්මක විය යුතුය."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල "කට්ටිකරු හෝ අඳ ගොවියා හැර වෙනත් තැනැත්තකු විසින් මේ ආඥාපනත යටතේ" යන වචන ඒ උපවගන්තිවල සිමර තැනක යෙදුන ද ඒ වෙනුවට "කට්ටිකරු හෝ අඳ ගොවියා හෝ ඉඩම් හිමි ගොවියා හෝ අවසර නොලත් ගොවියා හැර වෙනත් තැනැත්තකු විසින් මේ ආඥාපනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "කට්ටිකරු හෝ අඳ ගොවියා හැර වෙනත් තැනැත්තකුට මේ ආඥාපනත යටතේ වූ යම් වරදකට බලධරයා විසින් යම් දඩයක් හෝ දණ්ඩනයක් පනවමින්" යන වචන වෙනුවට "කට්ටිකරු හෝ අඳ ගොවියා හෝ ඉඩම් හිමි ගොවියා හෝ අවසර නොලත් ගොවියා හැර වෙනත් තැනැත්තකුට මේ ආඥාපනත යටතේ වූ යම් වරදකට බලධරයා විසින් යම් දඩයක් හෝ දණ්ඩනයක් පනවමින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"කට්ටිකරුවෝ, අඳ ගොවියෝ, ඉඩම් හිමි ගොවියෝ සහ අවසර නොලත් ගොවියෝ හැර වෙනත් තැනැත්තන්ගෙන් සහභාග මුදල් ආදිය අයකර ගැනීම."

6. 1968 අංක 48 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 78අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 78 අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "කට්ටිකරුවකු හෝ අඳ ගොවියකු" යන වචනවල සිට "ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක" යන වචන දක්වා වූ සියලු ම වචන වෙනුවට "කට්ටිකරුවකු, අඳ ගොවියකු, ඉඩම් හිමි ගොවියකු හෝ අවසර නොලත් ගොවියකු විසින් මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු හෝ ගෙවිය යුතු ලෙස සැලකෙන යම් සහභාග මුදලක් හෝ වෙනත් මුදලක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "දිසාපතිවරයා විසින් සහභාග මුදල හෝ වෙනත් මුදලක් ගෙවිය යුත්තේ යම් ඉඩමක් හෝ වාරි කර්මාන්තයක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම හෝ වාරි කර්මාන්ත පිහිටි ස්ථානයේ අධිකරණ බලය ඇත්තේ ගම් සභා අධිකරණයට හෝ" යන වචනවල සිට "සහතික කළ යුතු ය.", යන වචන දක්වා වූ සියලු ම වචන වෙනුවට "සහභාග මුදල හෝ වෙනත් මුදලක් හෝ ගෙවිය යුත්තේ යම් ඉඩමක් හෝ වාරි කර්මාන්ත සම්බන්ධයෙන් ද ඒ ඉඩම හෝ වාරි කර්මාන්ත පිහිටි ස්ථානයේ අධිකරණ බලය ඇත්තේ මහෙස්ත්‍රාත් අධිකරණයට දිසාපතිවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා දිසාපතිවරයාගේ සහතිකය, එම සහතිකයෙහි සඳහන් සහභාග මුදල හෝ වෙනත් මුදලක් හෝ එහි නම් සඳහන් තැනැත්තාගෙන් දිසාපතිවරයා වෙත ලැබිය යුතු බවට හා නැතහොත් ලැබිය යුතු ලෙස සැලකෙන බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය."; සහ

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"කට්ටිකරුවන්ගෙන්, අඳ ගොවියන්ගෙන්, ඉඩම් හිමි ගොවියන්ගෙන් සහ අවසර නොලත් ගොවියන්ගෙන් සහභාග මුදල් ආදිය අයකර ගැනීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තියේ "සෑම වාරිමාර්ග මූලාදෑනියකු ම, වරදකට වරදකරු වන අතර," යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලුම වචන වෙනුවට "ඒ වරද කරන ලද්දේ යම් ස්ථානයක ද ඒ ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් විභාග කරනු ලැබිය හැකි වරදකට වරදකරු වන අතර, ඒ සඳහා කරනු ලබන යම් නඩු පැවරීමක්, ඔහුගේ ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන් හානි සිදු වූ තැනැත්තා කෙරෙහි ඇති ඔහුගේ සිවිල් වගකීමට කොන යම් ආකාරයකින් හෝ බලපාන ලෙස අර්ථකථනය නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තියේ "ගම්බද අධිකරණය" යන වචන වෙනුවට "මහෙස්ත්‍රාත් අධිකරණය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියේ "හෝ ගම්බද අධිකරණය" යන වචන අතහැර දැමීමෙන් . ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ගම්බද අධිකරණ ආඥාපනතින් ගම්බද අධිකරණයක් වෙත ප්‍රදානය කරනු ලද බලතලවලට අතිරේකව" යන වචනවල සිට "පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—" යන වචන දක්වා වූ සියලු ම වචන වෙනුවට "වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා, මහෙස්ත්‍රාත් අධිකරණයකට මේ ආඥාපනතින් පවරන ලද අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී දී ඒ අධිකරණයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල "ගම්බද අධිකරණය" යන වචන ඒ උපවගන්තිවල කුමර තැනක යෙදුන ද ඒ වෙනුවට "මහෙස්ත්‍රාත් අධිකරණය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"මහෙස්ත්‍රාත් අධිකරණයේ බලතල.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

වාරිමාර්ග දඩ අරමුදල.

110. (1) වාරිමාර්ග දඩ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන (මින් මතු මේ වගන්තියේ "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) මේ කොටස යටතේ පනවන ලද සියලු දඩ හා දණ්ඩන ද 66 වන වගන්තිය යටතේ අයකර ගනු ලබන සියලු වියදම් ද අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්—

(අ) යම් වාරිමාර්ග ඉදි කිරීමකට සිදු කරන ලද යම් අලාභහානියක් අලුත්වැඩියා කිරීමට ;

(ආ) යම් කට්ටිකරුවකු හෝ අඳ ගොවියකු හෝ ඉඩම් හිමි ගොවියකු විසින් දරන ලද යම් අලාභයක් සම්බන්ධයෙන් වන්දි ගෙවීමට ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් අලාභයක් හෝ (ආ) ඡේදයෙහි සඳහන් වන්දි හෝ හානි පේරූ කිරීම සඳහා දීමට සිදු වූ වියදම් පියවීමට

අවශ්‍ය යයි සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අරමුදල් පරිපාලනය පිළිබඳව වගකීම භාර ගත යුතු ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(6) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.'

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. "ඉඩම" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 118 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "අවසර නොලත් භුක්තිකයා" යන්නෙන්—

(අ) රජයේ ඉඩම් ආඥාපනත යටතේ හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ හෝ වෙනත් ප්‍රඥප්තියක් යටතේ හෝ පවරනු නොලැබූ යම් රජයේ ඉඩමක් ගොවිතැන් කරන්නා ; හෝ

(ආ) රජයේ ඉඩම් ආඥාපනත යටතේ හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ හෝ කට්ටිකරුවකුට පවරන ලද්දේ වූ ද ඒ කට්ටිකරු විසින් අතහැර දමන ලද්දේ වූ හෝ නීති විරෝධී ලෙස නියාදනය කරන ලද්දේ වූ ද යම් රජයේ ඉඩමක් ගොවිතැන් කරන්නා

අදහස් වේ.'.

[illegible]

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.